# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2123/36 - 2019 මැයි මස 15 වැනි බදාදා - 2019.05.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

*මගේ අංකය:* මහ/පාලන/05/විදුලි/135/1.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇරැව්වල ගමේ (මහරගම නගර සභා සීමාව තුළ) පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක කො 9816 හි පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1939 ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම,

*මූ.පි.කො. 9816*

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: -; ඉඩම් පරිහරණය: පාර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ඒ. ඩී. සී. ජේ. පෙරියප්පෙරුම සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0100.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: කැකුණගහවත්ත සහ දෙල්ගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, අධි බලැති විදුලි රැහැන් කණුවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ඒ. ඩී. සී. ජේ. පෙරියප්පෙරුම සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0018.

03. **කැබලි අංක 03**

ඉඩමේ නම: කැකුණගහවත්ත සහ දෙල්ගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ඒ. ඩී. සී. ජේ. පෙරියප්පෙරුම සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.1821.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2019 ජූනි මස 12 දින පූ.භා. 9.00ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ වියයුතුයි.

තව ද 2019.05.31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. තව ද තමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

එම්. එම්. කේ. දිල්රුක්ෂි වල්පොල,
ප්‍රාදේශීය ලේකම්,
මහරගම.

2019 මැයි මස 15 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහරගම.

05 - 828

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 30074 - 22 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.